ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
இலங்கை பத்திரிகை ஸ்தாபனம்
Sri Lanka Press Institute

United Nations Educational, Scientific and Cultural Organization
New Delhi Office
Cluster Office for Bangladesh, Bhutan, India, Maldives, Nepal and Sri Lanka

ශ්‍රී ලංකාවේ

# ජනමාධ්‍යවේදිනියන්ගේ ආරක්ෂාව සඳහා

## ආදර්ශ මාර්ගෝපදේශය

May 2021



# මාර්ගෝපදේශ සැකසුම සඳහා පසුබිම

කාන්තා ජනමාධ්‍යවේදීන්ට සහ කාන්තා මාධ්‍ය වෘත්තිකයින්ට සැබෑ ලෝකයේදී මෙන්ම අන්තර්ජාලය හරහාත් ඔවුන්ගේ ආරක්ෂාව කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරන ලද අවස්ථාවන්ගේ සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබේ. ඒවා හිරිහැර කිරීම්, අපකීර්තියට ලක් කිරීම්, ලිංගික වෛරී කථාව, ඒකාකෘතිකරණය, විහිළුවට ලක් කිරීම, ඔවුන් ගැන සෝදිසි කිරීම, බිය ගැන්වීමේ ක්‍රියා, ශාරීරික පහරදීම්, ස්ත්‍රී දූෂණ සහ මිනීමැරුම් දක්වා විහිදේ.

ඉහත දැක්වූ කරදරවලට ජනමාධ්‍යවේදීන් ලෙස බාහිරව මුහුණ දෙන ඔවුන්, රැකියා ස්ථානය තුළ අභ්‍යන්තරිකවත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට ඔවුන්ට මුහුණ දෙයි. එනම්, කාන්තා ජනමාධ්‍යවේදීන් සාමාන්‍යයෙන් ආරක්ෂිත ස්ථාන විය යුතු තමන්ගේ සේවා ස්ථානවලදී පවා තර්ජනයන්ට මුහුණ දෙති. ඉන් මාධ්‍යවේදීනියන්ට ඔවුන්ගේ රැකියාව කිරීමට අපහසු ශාරීරික හා මානසික ආතතියක් ගොඩ නැගේ. පහත දැක්වෙන්නේ මාධ්‍යවේදීනියන් සඳහා හිතකර සේවා පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මාධ්‍ය ආයතන වෙත කරන ප්‍රධාන නිර්දේශයන් කිහිපයකි.



## පෙරවදන

මෙය, මාධ්‍යවේදිනියන් රැකියා පරිසරය තුළ ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාවලි හා ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා මාධ්‍ය ආයතන සහ සංවිධාන වෙත පිදෙන ආදර්ශ මාර්ගෝපදේශයකි. මෙම මාර්ගෝපදේශය කාන්තා මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව පිළිබඳ විවිධ අංශ කෙරෙහි අවධානය යොමු කරයි. මෙම මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් කාන්තා මාධ්‍යවේදීන් මුහුණපාන අවදානම් අවම කිරීම සඳහා ආයතනය තුළ ආරක්ෂිත පරිසරයක් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම මාර්ගෝපදේශය මාධ්‍යවේදිනියකට අභියෝගයක් විය හැකි සියලු අවදානම් මුලිනුපුටා දැමීම සහතික නොකරන නමුත් අභියෝගයන්ට මුහුණ දීම සඳහා ධනාත්මක මග පෙන්වීමක් සපයන බව සඳහන් කළ යුතුය.

මෙම මාර්ගෝපදේශය ප්‍රධාන වශයෙන් මාධ්‍යවේදිනියන් කෙරෙහි අවධානය යොමු කල ද, දී ඇති බොහෝ නිර්දේශ ස්ත්‍රී පුරුෂ භාවය නොසලකා සියලු මාධ්‍යවේදීන්ට අදාළ කර ගත හැකි වේ.

## නිර්දේශ ක්‍රියාත්මක කරන්නන්:

මාධ්‍ය ආයතන/ සංවිධාන මේ ආකාරයේ මාර්ගෝපදේශයක් ක්‍රියාත්මක කරන්නේ නම් අදාළ සම්පත් ලබා ගත හැකි බවට සහතික කිරීම සහ ඊට අනුකූල වීම සහතික කිරීම සඳහා ප්‍රවෘත්ති අංශ ප්‍රධානියා සහ මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා එක්ව එය සිදු කරන්නේ නම් වඩාත් සුදුසුය.

# ආයතනික ආරක්ෂක කමිටුව

- අවදානම් අඛණ්ඩව සමාලෝචනය කරන ආයතනික ආරක්ෂණ කමිටුවක් පිහිටුවන්න.

- මෙම කමිටුවේ කාර්යභාරය වනුයේ සංවිධානයේ සියළුම මෙහෙයුම් අංශවල (උදා: මූල්‍ය, සැපයුම්, මානව සම්පත්, මෙහෙයුම් යනාදියේ) අවදානම් හඳුනා ගැනීමයි. එමඟින් කාන්තාවන්ට විශේෂිත අවදානම් කෙරෙහි අවධානයක් යොමු කළ යුතුය.

- අදාළ අංශවල ප්‍රධානීන් කමිටුවට ඇතුළත් විය යුතු අතර ව්‍යවසාය අවදානම් කළමනාකරණ නිලධාරියාගේ ප්‍රධානත්වයෙන් හෝ ඔහු/ඇය නොමැති විට මෙම වගකීම සහිත කිරීමට නම් කරන ලද වෘත්තිකයෙකු ඊට ඇතුළත් විය යුතුය.

- හදිසි අවස්ථා වලදී සංවිධානයේ සියලු මට්ටම් කරා ළඟා වන පරිදි තොරතුරු සන්නිවේදනය සහතික කිරීම සඳහා හදිසි සන්නිවේදන සැලැස්මක් පිහිටුවීම.



# ආධාරක යාන්ත්‍රණ

- හදිසි ඇමතුම් ලැයිස්තුවක් සහ ජනමාධ්‍යවේදීන්ට රැගෙන යා හැකි සහ නිරන්තරයෙන් යාවත්කාලීන කළ හැකි මාර්ගෝපදේශ අත්පොතක් සකස් කරන්න.

- නිතිපතා වැඩ කටයුතු කරගෙන යාම සඳහා නීතිමය උපදෙස් සහ සහාය ලබා දීම සඳහා අභ්‍යන්තරික හෝ විශේෂිත යාන්ත්‍රණයක් ඇති බවට සහතික වීම.

- සෑම මාධ්‍යවේදියෙකුටම අදාල ආරක්ෂිත උපදෙස් සහ මාර්ගෝපදේශ සහිත සවිස්තරාත්මක අත්පොතක් ලබා දෙන්න. මෙම අත්පොතෙහි මාධ්‍යවේදීනියන් මුහුණ දෙන අවදානම් සහ ඒවා අවම කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ඇතුළත් විය යුතුය. මෙම අත්පොත නිතිපතා සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය.

- ආයතනය/සංවිධානය තුළ ඇති ආරක්ෂාවට අදාළ විවිධ ගැටළු පිළිබඳ පැමිණිලි විසඳීම සඳහා දුක්ගැනවිලි ක්‍රියා පටිපාටියක් සහ අයථා ක්‍රියා දැනුම් දීමේ ප්‍රතිපත්තියක් ඇති බවට සහතික විය යුතුය. සියළුම තොරතුරු සංවේදී බැවින් රහස්‍ය බවට සැලකිය යුතු අතර මෙම ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කරන අයට අසාධාරණ බලපෑම් එල්ල නොවන බවට සහතික විය යුතුය.

- ජනමාධ්‍යවේදීන් සිය රැකියා කරගෙන යාමේදී ඇතිවිය හැකි අවදානම් අවබෝධ කර ගැනීම සඳහා වාර්ෂික සමීක්ෂණයක් පැවැත්වීම සහ එමඟින් අවදානම් අවම කිරීමේ උපාය මාර්ග සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම.



# පුහුණුව

- නව කාර්ය මණ්ඩලය වෙත ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදීතා සැසි සහිත වැඩසටහන් පවත්වන්න.

- අදාළ නීති සහ රෙගුලාසි, භෞතික ආරක්ෂාව, අන්තර්ජාල / ඩිජිටල් ආරක්ෂාව, අවදානම් තක්සේරු කිරීම, ප්‍රථමාධාර යනාදිය පිළිබඳව ජනමාධ්‍යවේදීන්ට වාර්ෂික ආරක්ෂක පුහුණුව ලබා දීම සහ ඔවුන්ගේ රාජකාරිය ඉටු කිරීමේදී ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීම.

- සංවිධානයේ විවිධ මට්ටම් (ජ්‍යෙෂ්ඨ කළමනාකරණය, මධ්‍යම කළමනාකරණය, ප්‍රවෘත්ති අංශ, සහාය කණ්ඩායම් ආදිය) අතර වාර්ෂික ස්ත්‍රී පුරුෂ සංවේදීතා පුහුණු/සැසි/සාකච්ඡා පැවැත්වීම.

# භෞතික ආරක්ෂාව

- ජනමාධ්‍යවේදිනියන් සඳහා ප්‍රවාහන පහසුකම් සැලසුම් සකස් කිරීම සෑම අවස්ථාවකම මූලික අදියරේ කොටසකි. පුවතක් වාර්තා කිරීමට නව පරිසරයකට සංචාරය කිරීමට අවශ්‍ය නම්, කාර්යය මෙහෙයවිය යුතු ආකාරය පිළිබඳ තීරණ ගැනීම සඳහා ස්ථානය, භාෂාව, සංස්කෘතිය සහ සිරිත් විරිත් කල්තියා ගවේෂණය කරන්න.

- ඉහළ අවදානම් අවස්ථාවන්ට යෙදවීමට පෙර අවදානම් තක්සේරු කිරීම අනිවාර්ය කළ යුතුය (නිදසුනක් ලෙසඃ සන්නද්ධ ගැටුම් තත්වයක්, කොවිඩ් -19 වැනි වසංගත තත්වයන්, ප්‍රචණ්ඩ ක්‍රියා සහ විරෝධතා)

- ජනමාධ්‍යවේදීන්ගේ තමාගේ නම, තනතුරු සහ තමා අයත් සංවිධාන නියෝජනය කරන වලංගු හැඳුනුම්පත් සෑම විටම ළඟ තබා ගන්නා බවට සහතික වන්න.

- සංවිධානයේ / ප්‍රවෘත්ති අංශයේ බලයලත් ආරක්ෂක නිලධාරියෙකු විසින් සිද්ධියක් ආවරණය කිරීමේදී ආරක්ෂිත නවාතැන්, ප්‍රවාහන හා යා යුතු මාර්ග පිළිබඳව මාධ්‍යවේදීන්ට උපදෙස් දිය යුතුය.

- වාර්තා කටයුතු සහ රැකියා කරන වේලාවන්හි ගමන් කරන විට ප්‍රවාහනය සහ සැපයුම් සම්බන්ධයෙන් මාධ්‍යවේදිනියන්ගේ ආරක්ෂාව වෙත විශේෂ අවධානයක් දක්වන ප්‍රතිපත්ති ඇතුළත් විය යුතුය.

- රැකියා කටයුතු සඳහා ආයතනික විද්‍යුත් තැපැල් ගිණුම් පිහිටුවන්න.



# ඩිජිටල් ආරක්ෂාව

- අන්තර්ජාලය හරහා කටයුතු කරන මාධ්‍යවේදීන් මුහුණ දෙන සයිබර් තර්ජනවලට මුහුණ දීම සඳහා අධීක්ෂණ සහ පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කරන්න. හඳුනාගත් තර්ජන සහ ඒ හා සමාන තර්ජන නැවත ඇති වීම වළක්වා ගැනීම සඳහා අදාළ බලධාරීන් වන CERT, සයිබර් අපරාධ අංශය වැනි අදාල නෛතික අංශ වෙත වාර්තා කළ යුතුය.

- සංවිධානය වෙතට හා ඉන් පිටතට යන දත්ත ආරක්ෂා කිරීම සඳහා යාවත්කාලීන කරන ලද නූතන ෆයර්වෝල් පද්ධතියක් ක්‍රියාත්මක විය යුතුය.

- සෑම අයෙකුටම ගෝලීය ප්‍රමිතීන්ට අනුව පරිශීලක නාම සහ මුරපද ලබා දී ඇති බවටත්, මධ්‍යගත ප්‍රවේශ පාලන පද්ධතියක් හරහා එම පිවිසුම් මාසිකව හෝ වෙනස් වන බවට සහතික වන්න.

- සෑම ඩිජිටල් උපාංගයකම අන්තර්ජාල හා වෛරස් ආරක්ෂක මෘදුකාංග ස්ථාපනය කර තිබිය යුතුය.

- සියලුම ඩිජිටල් උපාංගවල දත්ත ගබඩා කිරීමේදී ආකේතන (Encryption) තාක්ෂණයන් ක්‍රියාත්මක කළ යුතුය.

- සමාජ මාධ්‍ය භාවිතය සහ ක්‍රියාකාරිත්වය පිළිබඳ මාර්ගෝපදේශ සැපයීම / ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම.

- අදාළ ඩිජිටල් උපාංගවල නිරන්තර ආරක්ෂක යාවත්කාලීන කිරීම් ලැබෙන බව සහතික කිරීම සඳහා අව්‍යාජ (Genuine) මෘදුකාංග ස්ථාපනය කරන්න.

# මානසික රැකවරණය

- කම්පන සහගත අවස්ථාවන්ට ගොදුරු වූවන්ට මානසික හා චිත්තවේගීය සහය ලබා දීම සඳහා පුද්ගලයකු හෝ සේවාවක් හෝ කාර්ය මණ්ඩල සත්කාරක යාන්ත්‍රණයක් මානව සම්පත් අංශය හරහා ලබා දිය යුතුය.

- මාධ්‍යවේදිනියන් එදිනෙදා මුහුණ දෙන අභියෝග අවබෝධ කර ගැනීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව සහ ප්‍රවෘත්ති අංශ ප්‍රධානීන් රැස්වීම් පැවැත්විය යුතුය.

# උපග්‍රන්ථය 1

## (1). ව්‍යවස්ථාමය ආරක්ෂණ විධිවිධාන

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිංග භේදය නොසලකා, සියලුම ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයිතිවාසිකම් සහතික කරන නීතිමය විධිවිධාන සපයනු ලබයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සියලු ආකාරයේ අමානුෂික හෝ පහත් සැලකීම් සහ දඬුවම්, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, තොරතුරු ලබා ගැනීම සහ සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් වලින් වැළකී සිටීම සහතික කෙරේ. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙතැනින් බැලිය හැකිය:

https://www.parliament.lk/files/pdf/constitution.pdf

### තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත

2015 වසරේ දී පාර්ලිමේන්තුවේ සම්මත කළ 19 ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනය මගින් 14 (අ) වගන්තිය යටතේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම මූලික අයිතිවාසිකමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවට ඇතුළත් කෙරිණ. ඒ පිළිබඳ නීතිය 2016 අංක 12 දරණ පනත (RTI Act) මගින් හඳුන්වා දී ඇත. එම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ නීතිය ක්‍රියාත්මකවීමට අවශ්‍ය නියෝග 2017 පෙබ 03 දින, අංක 2004/66 දරණ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇත.

**තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත මෙතැනින් බලන්න**
https://www.rti.gov.lk/images/resources/RTI_ Act_Sri_Lanka_E.pdf

**2017 පෙබරවාරි 03 දින හා අංක 2004/66 දරන අති විශේෂ ගැසට් පත්‍රය**
http://www.moha.gov.lk/web/images/RTI/2004-66_s.pdf

## (2). ස්ත්‍රී දූෂණ හා ලිංගික හිංසනයන්ට අදාළ දණ්ඩ නීතිය සහ වෙනත් නීති

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය මගින් කාන්තාවන්ට සිදුවන ස්ත්‍රී දූෂණ සහ ලිංගික හිංසනයන් තහනම් කර තිබේ. ස්ත්‍රී දූෂණය, බරපතල ලිංගික අපයෝජනය සහ ලිංගික හිරිහැර සම්බන්ධ විධිවිධාන මෙයට ඇතුළත් ය. සාක්ෂි ආඥා පනත සහ අපරාධ නඩු විධාන සංග්‍රහය ස්ත්‍රී දූෂණ චෝදනාවක් සම්බන්ධයෙන් නඩු පැවරීමේ ක්‍රියා පටිපාටිය සහ සාක්ෂි පිළිබඳ නීති රීති දක්වනු ලබයි. ස්ත්‍රී දූෂණය පිළිබඳ වරද දණ්ඩ නීති සංග්‍රහයේ 363 වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති අතර එය දූෂණයට ලක්වූ සියලු දෙනාටම අදාළ වේ.

කාන්තාවක් අන්තර්ජාලය හරහා ලිංගික හිරිහැරයකට හෝ ප්‍රචණ්ඩත්වයකට මුහුණ දෙන්නේ නම්, දණ්ඩ නීති සංග්‍රහයේ 345, 372 සහ 483 වගන්ති මගින් ඇයට රැකවරණය ලැබේ.

**දණ්ඩ නීති සංග්‍රහය වෙත සබැඳියක් පහත දැක්වේ:**
https://www.lawnet.gov.lk/penal-code-consolidated-2/

සයිබර් ලිංගික හිංසනයක වින්දිතයෙකුට රැකවරණය සපයන තවත් නීති තිබේ. අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත, පරිගණක අපරාධ පනත සහ ගෙවීම් උපාංග වංචා පනත ඉන් කිහිපයකි.

**අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත** -
http://www.mediareform.lk/wp-content/uploads/2020/03/164-Obscene-Publications-Ordinance-No.04-of-1927.pdf

**පරිගණක අපරාධ පනත** - https://www.srilankalaw.lk/?id=239&lang=en

**ගෙවීම් උපාංග වංචා පනත** - https://www.lawnet.gov.lk/payment-devices-frauds-2/#:~:text=AN%20ACT%20TO%20PREVENT%20THE,INVESTIGATION%2C%20PROSECUTION%20AND%20PUNISHMENT%20OF

## (3). කම්කරු නීතියේ වැදගත් කොටස් කිහිපයක්

ශ්‍රී ලංකාවේ කම්කරු නීතිය මගින් සේවකයින්ගේ සේවා කාලය,
සේවකයින්ගේ අවම වැටුප, සේවක
අර්ථසාධක අරමුදල (ඊපීඑෆ්) සහ සේවක භාර අරමුදල (ඊටීඑෆ්)
ශ්‍රී ලංකාවේ කම්කරු නීතිය මගින් සේවකයින්ගේ වැඩකරන වේලාවන්, සේවකයින්ගේ අවම වැටුප, සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) සඳහා වන හිමිකම් ආවරණය කරයි.

කම්කරු නීතියේ ඇතැම් විධිවිධාන පහත සබැඳි භාවිතයෙන් ලබා ගත හැකිය:

**සාප්පු හා කාර්යාල සේවක පනත** - https://www.srilankalaw.lk/Volume-VII/shop-and-office-employees-regulation-of-employment-and-remuneration-act.html

**කර්මාන්තශාලා ආඥා පනත** - https://www.ilo.org/dyn/travail/docs/1684/1_factories_ordinance_i.pdf

**අවම සේවක වැටුප් පනත** - https://www.srilankalaw.lk/YearWisePdf/2016/03-2016_E.pdf

**මාතෘ ප්‍රතිලාභ ආඥා පනත** - http://www.ilo.org/dyn/natlex/natlex4.detail?p_lang=en&p_isn=27182

**ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මාතෘ ආරක්ෂණ සම්මුතිය** - https://www.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB%20:12100:0::NO::P12100_ILO_CODE:C103

**කම්කරුවන්ගේ රැකියා අවසන් කිරීම (විශේෂ ප්‍රතිපාදන) පනත** - http://labourdept.gov.lk/images/PDF_upload/chapter01/6_termination_of_employment_of_workmen.pdf

## (4). වෙනත් බලධාරීන්

### ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම

මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්යයන් වනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ප්‍රවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම, සහ ශ්‍රී ලංකා රාජ්‍ය ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම යි. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් හෝ ආසන්න වශයෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි විභාග කිරීම සහ වන්දි ගෙවීම ඇතුළුව සුදුසු සහනයක් ලබා දීමට සහ පරීක්ෂා කිරීමට සහ බාධාවකින් තොරව ප්‍රවේශ වීමටත්, පුද්ගලයෙකුට නිදහස අහිමි වූ ඕනෑම ස්ථානයක් නිරීක්ෂණය කිරීමටත් කොමිසමට පුළුල් බලතල ඇත.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත** - https://www.hrcsl.lk/about/hrcsl-act/

info@slpi.lk

+94 115 353 635

+94 115 335 500

www.slpi.lk

ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය,
අංක 96, කිරුළ පාර, කොළඹ 05.

@SriLankaPressInstitute

slpi_media

SLPI